# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# 2022

අමාත්‍ය මණ්ඩල කාර්යාලය - ශ්‍රී ලංකාව
அமைச்சரவை அலுவலகம் – இலங்கை
OFFICE OF THE CABINET OF MINISTERS - SRI LANKA

# කාර්යසාධන වාර්තාව 2022

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ශ්‍රී ලංකාව

## පටුන

| අන්තර්ගතය | | | පිටු අංක |
|---|---|---|---|


| | | | |
|---|---|---|---|
| **පරිච්ඡේදය 01** | - | ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 04-06 |
| **පරිච්ඡේදය 02** | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 07-12 |
| **පරිච්ඡේදය 03** | - | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 13-17 |
| **පරිච්ඡේදය 04** | - | කාර්යසාධන දර්ශක | 18 |
| **පරිච්ඡේදය 05** | - | තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය | 19 |
| **පරිච්ඡේදය 06** | - | මානව සම්පත් පැතිකඩ | 20-23 |
| **පරිච්ඡේදය 07** | - | අනුකූලතා වාර්තාව | 24-29 |
| **ඇමුණුම I** | - | 2022 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාමලේඛනය | 30-36 |
| **ඇමුණුම II** | - | එක් එක් අමාත්‍යාංශ විසින් යොමු කරන ලද සංදේශ සංඛ්‍යාව | 37-40 |
| **ඇමුණුම III** | - | ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය | 41-42 |
| **ඇමුණුම IV** | - | රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය | 43-44 |
| **ඇමුණුම V** | - | විගණකාධිපති වාර්තාව | 45-50 |

## 01 පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජනරජයේ ආණ්ඩුවේ පාලනය, මෙහෙයවීම හා විධානයට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයට සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 51(2)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබයි.

## 1.2 දැක්ම

ජනරජයේ පාලනය මෙහෙයවීම සඳහා විධායකයට සහාය වන වඩාත් විශ්වසනීය රාජ්‍ය ආයතනය වීම.

### මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) අනුව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති ජනරජයේ පාලනය මෙහෙයවීම පිණිස තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියලුම සහායයන් කාර්යක්ෂම ලෙස ලබා දීම.

### අරමුණු

අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා විසින් දැනුම්වත් තීරණ ගැනීමට හැකිවන පරිදි එම තීරණ ගැනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සහ අනලස්ව සහාය වීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීමට අදාළ උපදෙස් අමාත්‍යාංශ වෙත ලබා දීම සහ එම කාර්යයේදී අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මඟපෙන්වීම.

- ප්‍රතිපත්ති සම්පාදනය හා ජනරජයේ පාලනය මෙහෙයවීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත්, අදාළ අමාත්‍ය

මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳව නිසි අවබෝධයෙන් තීරණ ගැනීමට පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ සඳහා යොමු කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ නිරීක්ෂණ සමඟ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත සහ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමේදී සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී එළඹි තීරණ ඇතුළත් වාර්තා භාෂාත්‍රයෙන් සකස් කිරීම හා එකී වාර්තා අමාත්‍යවරුන් වෙතත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ වෙනත් බලධරයන් වෙතත් යොමු කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම් සඳහා අවශ්‍ය සියලු සේවාවන් සැලසීම.

- අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අදාළ අමාත්‍යාංශ වෙත දැනුම් දීම.

- විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කටයුතු කිරීම.

- අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන වෙනත් කවර හෝ කාර්යයන් ඉටු කිරීම.

## 1.4 සංවිධාන සටහන

ORGANIZATIONAL STRUCTURE – OFFICE OF THE CABINET OF MINISTERS



1.5 **අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල -** අදාළ නොවේ.

1.6 **අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතනය / අරමුදල්** - අදාළ නොවේ.

1.7 **විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්)** - අදාළ නොවේ.

## 02 පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්

2.1.1 2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල රැස්වීම් 47ක් පවත්වන ලදී. අමාත්‍ය මණ්ඩලයේ තීරණ අපේක්ෂාවෙන් විවිධ අමාත්‍යාංශවලින් අමාත්‍ය මණ්ඩල සංදේශ (අමාත්‍ය මණ්ඩල සංදේශ සහ සටහන් යන දෙවර්ගයම මින් අදහස් වේ.) 2,214ක් 2022 වසර තුළ ඉදිරිපත් කරනු ලැබිණි. 2022 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාමලේඛනය ඇමුණුම I හි දැක්වේ. (2022 වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් වී ඇත.) එක් එක් අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව ඇමුණුම II හි දැක්වේ.

2.1.2 මෙකී සංදේශ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එම සංදේශ පිළිබඳ නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම සහ එම යෝජනාවලින් පැනනැගිය හැකි සංකූලතා ආදිය ගැන ගැඹුරින් අධ්‍යයනය කර අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

2.1.3 අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළව එළඹි තීරණ ඇතුළත් වාර්තා මෙම කාර්යාලය විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් සකස් කර අමාත්‍යවරුන් වෙතත්, අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබූ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙතත් යොමු කරන ලදී.

*වගුව I : 2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කරන ලද කාර්යය අනුව සකසන ලද වර්ගීකරණයක සාරාංශය:*

| කාණ්ඩය | සංදේශ ගණන |
|---|---|
| ප්‍රතිපත්තිමය කටයුතු | 988 |
| ව්‍යවස්ථා සම්පාදනයට අදාළ කටයුතු | 193 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු ආයතනික කටයුතු | 293 |
| ප්‍රසම්පාදන කටයුතු | 414 |
| වාර්ෂික වාර්තා | 326 |
| එකතුව | 2214 |

2.1.4 අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව, මහජනතාව විසින් දැනගත යුතු යැයි හඳුනාගනු ලබන සංවර්ධන ව්‍යාපෘති, සුබසාධන වැඩසටහන්, රජයේ ප්‍රසම්පාදන කටයුතු, විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යනාදී විශේෂ අමාත්‍ය මණ්ඩල තීරණවල සාරාංශ ඇතුළත් වාර්තාවක් එදිනම සකස් කොට එය අමාත්‍ය මණ්ඩලයේ සමමාධ්‍ය ප්‍රකාශකවරුන් වශයෙන් කටයුතු කරනු ලබන ගරු අමාත්‍යතුමන්ලා වෙත සහ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ. ඊට අමතරව එම තොරතුරු අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වූ දිනට පසු දින වන විට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී.

## 2.2 2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

අමාත්‍ය මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරලීම පිණිස නිශ්චිත ක්ෂේත්‍ර හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අතර ඒවා 2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

(අ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

### (අ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආයතන කටයුතුවලට අදාළව පහත සඳහන් බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත:

- රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම [55 වැනි ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව].

- දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම [55 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව].

මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී යෝග්‍යතම තීරණයට එළඹීමට අමාත්‍ය මණ්ඩලයට පහසු වනු පිණිස අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කෙරුණු සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කාර්යභාරය වේ. මෙයට අමතරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යවසායයන් හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස අනුමැතිය ලබා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කර ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම ද ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත පැවරී ඇත.

2022 වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවති ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය ඇමුණුම III හි දැක්වේ. (2022 වර්ෂය තුළ මෙම අනුකාරක සභාවේ සංයුතිය අවස්ථා කිහිපයක දී වෙනස් වී ඇත.)

දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම සඳහා වූ සංදේශ මෙම කාර්යාලය වෙත ලද වහාම නිර්දේශිත නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන ඇත්ද යන්න හෝ එසේ කිරීමට අදහස් කර ඇත්ද යන්න පිළිබඳව එම නිලධාරීන් අයත් වන සේවාවන්ට අදාළ පත්වීම් බලධරයා වෙතින් සහ පරිපාලන බලධරයා වෙතින් වාර්තා කැඳවීම සිදු කරනු ලැබේ.

විවිධ අමාත්‍යාංශ වෙතින් 2022 වර්ෂය තුළදී ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ විෂයපථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 293 ක් ඉදිරිපත් වී තිබූ අතර, එම සංදේශ පිළිබඳව සාකච්ඡා කිරීමට ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් 18 ක් පවත්වා ඇත. එකී අනුකාරක සභාවේ නිර්දේශ ඉන් පසු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.

පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ අතර, එම නිලධාරී කමිටුව සහභාගි වූ රැස්වීම් 18 ක් අදාළ වසර තුළ දී පැවැත්විණි.

## ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ නිලධාරී කමිටුව

I. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් (අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ ලේකම් / කැඳවුම්කරු)

II. අග්‍රාමාත්‍ය ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

III. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්

IV. භාණ්ඩාගාරයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු

V. ජනාධිපති ලේකම් විසින් නම් කරනු ලබන ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

VI. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්

VII. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

VIII. ආයතන අධ්‍යක්ෂ ජනරාල්

IX. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

එසේම අවශ්‍ය අවස්ථාවලදී ඇතැම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමට ද කටයුතු කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා, ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශ 293 සම්බන්ධයෙන්ම සිය තීරණ ලබා දී ඇති අතර, එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙත අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් යොමු කරනු ලැබ ඇත.

2022 වසර තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් පනස් හතර දෙනෙකු (54) පත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගන්නා ලද අතර ඒ සඳහා වූ පත්වීම් ලිපි අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලදී.

## (ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

2022 වර්ෂය තුළ දී රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ රැස්වීම් 15ක් පවත්වන ලදී. එම අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වීම පිණිස පත්කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරි කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා කටයුතු කරන ලදී. 2022 වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවති රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය ඇමුණුම IV හි දැක්වේ. (2022 වර්ෂය තුළ මෙම අනුකාරක සභාවේ සංයුතිය අවස්ථා කිහිපයක දී වෙනස් වී ඇත.)

### රාජ්‍ය වියදම් කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ නිලධාරි කමිටුව

i. ජනාධිපති ලේකම්

ii. අග්‍රාමාත්‍ය ලේකම්

iii. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

iv. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්

v. ජනාධිපති අතිරේක ලේකම්වරයෙකු

## 2.3 2022 වසර තුළ සිදු කරන ලද විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යභාරයන්:

2.3.1 අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වන නිලධාරි කමිටුවේ සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වන නිලධාරි කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලදී.

2.3.2 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාළව ක්‍රියාත්මක කිරීම එම පනත බලාත්මක වීම ආරම්භ වූ 2017-02-03 දින සිටම සිදු කිරීමට පියවර ගන්නා ලද අතර 2022 වර්ෂය තුළදී ද එම පනත යටතේ කටයුතු සිදු කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා 'නම් කළ නිලධාරි' ලෙසත් මෙම කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු 'තොරතුරු නිලධාරි' ලෙසත් වසර තුළදී කටයුතු කරන ලදී. මෙම කාර්යාලයට අදාළ ලේඛන හා සබැඳි තොරතුරුවලට ප්‍රවේශ විය හැකි ආකාරය, ඒ සඳහා අදාළ අයදුම්පත් සහ ආකෘතිපත්‍ර සහ ඒ පිළිබඳ අනෙකුත් තොරතුරු කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කිරීමට ක්‍රියා කරන ලදී. 2022 වර්ෂය තුළ තොරතුරු ඉල්ලීමේ අයදුම්පත් 95ක් මෙම කාර්යාලය වෙත ඉදිරිපත් වූ අතර ඒ සියලුම තොරතුරු ඉල්ලීමේ අයදුම්පත් සඳහා ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරන ලදී.

## 2.4 අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය :

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරයේ සුවිශේෂත්වය නිසා බොහෝ අවස්ථාවලදී අනෙකුත් රජයේ ආයතනවල කටයුතු කෙරෙන සාමාන්‍ය ආකාරයෙන් බැහැරව කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදුවේ. විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩල රැස්වීම් 02ක් අතර කාලපරතරය සතියකට පමණක් සීමා වන බැවින් පහත ආකාරයේ කල් දැමිය නොහැකි කාර්යභාරයන් රැසක් ඉතාම කෙටි කාලයක් තුළ ඉටු කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යමණ්ඩලය වෙත පැවරී ඇත.

- ඊළඟ සඳුදා පැවැත්වෙන සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය හා ඊට අදාළ සංදේශ ඊට පෙර සතියේ බදාදා දිනයන්වල ගරු අමාත්‍යතුමන්ලා වෙත යැවිය යුතු අතර පෙර සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව එම සතියේ බ්‍රහස්පතින්දා පෙරවරුව වන විට භාෂාත්‍රයෙන් පිළියෙල කොට පරිපූරක න්‍යාය පත්‍රය සඳහා හඳුනාගත් සංදේශ කිසිවක් වෙතොත් ඒවා ද සමඟ සිකුරාදා දිනය තුළ ගරු අමාත්‍යතුමන්ලා වෙත භාර දීම පිණිස අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීම.
- ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට අදහස් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවල අන්තර්ගත කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම
- එම සංදේශවලට අදාළ අවශ්‍ය අතිරේක තොරතුරු රැස් කිරීම හා එම කරුණු සම්බන්ධයෙන් මීට පෙර අමාත්‍ය මණ්ඩල තීරණ කිසිවක් තිබේ නම් ඒ පිළිබඳ සොයා බැලීම
- ඇතැම් සංදේශවල සඳහන් යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී පැනනැඟිය හැකි ප්‍රතිපත්තිමය හා නෛතික සංකූලතා ගැන අධ්‍යයනය කිරීම (අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්)
- එම සංදේශවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන පරිදි ඒ ඒ අමාත්‍යාංශ භාර ගරු අමාත්‍යතුමන් වෙතින් නිරීක්ෂණ ලබා ගැනීම හා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් වැඩිදුර පැහැදිලිකිරීම් ලබා ගැනීම.

අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අමතරව ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සහ රාජ්‍ය වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ රැස්වීම්වලට අදාළ වාර්තා පිළියෙල කිරීම හා එම වාර්තා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාළ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත යොමු කිරීම ද ඒ ඒ සතිය තුළ සිදු කළ යුතුය.

මෙම සියලු කටයුතු කිරීමේදී එම කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම නිලධාරීන්ගේ වගකීමක් වන අතර එය ඉහළ මට්ටමින් පවත්වා ගනිමින්, සතියේ දිනවල සාමාන්‍ය රාජකාරි වේලාවන් ඉක්මවා රාත්‍රී කාලයේ ද රාජකාරියේ නිරත වීමටත්, සතිඅන්ත දිනවල හා රජයේ නිවාඩු දිනවල ද සේවයේ යෙදීමටත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිලධාරීන්ට සිදු විය.

මෙම හේතුව නිසා අමාත්‍ය මණ්ඩල කාර්යාලයට නිලධාරීන් බඳවා ගනු ලැබීමේදී ඉහත සඳහන් අවශ්‍යතාවන්ට ගැලපෙන, විශේෂයෙන් තෝරාගත් කුසලතා සහිත නිලධාරීන් පිරිසක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබ ඇති අතර 2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයේ යෙදුනු නිලධාරීන් පිළිබඳ තොරතුරු 06 වන පරිච්ඡේදයෙහි ඇතුළත් වේ.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉටු කළ යුතු නෛතික කටයුතු සඳහා සහාය වීම පිණිස නීති උපදේශක තනතුරෙහි කටයුතු කරනු ලබන විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්වරියගේ සේවය කොන්ත්‍රාත් පදනම මත තවදුරටත් ලබාගන්නා ලදී.

## 2.5 අභියෝග හා ඉදිරි ඉලක්ක

ඉහත 1.3හි සඳහන් ප්‍රධාන කාර්යයන් 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
දිනය: 2023- 05 - 29

ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ලොයිඩ්ස් ගොඩනැගිල්ල
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 01.

# 03 පරිච්ඡේදය

# වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

ඒසීඒ-එෆ්

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022 රු. | | සටහන | සත්‍ය 2022 රු. | සත්‍ය 2,021 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 159,376,000 | 133,162,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 647,730 | 889,785 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 4,581,201 | 4,493,913 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 164,604,931 | 138,545,698 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 164,604,931 | 138,545,698 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 19,097 | 346,603 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 164,585,834 | 138,199,095 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 98,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 88,041,006 | 86,822,878 | ඒසීඒ-2(ii) |
| 84,750,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 49,015,483 | 30,175,943 | ඒසීඒ-2(ii) |
| 800,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 533,705 | 596,338 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 75,000 | - | ඒසීඒ-2(ii) |
| 183,650,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 137,665,194 | 117,595,159 | |
| | මූලධන වියදම් | | | | |
| 12,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 6,520,601 | 2,159,509 | ඒසීඒ-2(ii) |
| 21,800,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 17,946,453 | 19,397,455 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 273,430 | 280,386 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 34,300,000 | මුළු මූලධන වියදම් (උ) | | 24,740,483 | 21,837,350 | |
| | තැන්පතු ගෙවීම් | | 849,347 | 150,551 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 3,095,026 | 4,825,039 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 3,944,373 | 4,975,590 | |
| 217,950,000 | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 166,350,051 | 144,408,099 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (1,764,217) | (6,209,004) | |
| | අග්‍රිම හැඳුනුම් ප්‍රකාශය අනුව ශේෂය | | (1,764,217) | (6,209,004) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

1

ඒසීඒ-8

## 2022 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තතා 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 114,393,231 | 111,427,932 |
| කල්බදු ආයෝජන | | 21,719,660 | 35,437,340 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 12,548,638 | 14,034,813 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 346,603 |
| මුළු වත්කම් | | 148,661,528 | 161,246,688 |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 11,933,620 | 13,218,178 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 114,393,231 | 111,427.932 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| කල්බදු ණය හිමියෝ | | 21,719,660 | 35,437,340 |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 615,017 | 816,635 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 346,603 |
| මුළු වගකීම් | | 148,661,528 | 161,246,688 |

පිටු අංක 07 සිට 33 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 34 සිට 40 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ..................... | ..................... | ..................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2023-02-21 | දිනය : | දිනය : 2023/02/21 |

ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ලොයිඩ්ස් ගොඩනැගිල්ල
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 01.

යූ. එල්. චමිලා පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ලොයිඩ්ස් ගොඩනැගිල්ල
කොළඹ 01.

ඒසීඒ-3

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 3,690,177 | **3,287,168** |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම් | | 159,376,000 | 133,162,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 3,923,051 | 3,335,632 |
| තැන්පතු ලැබීම් | | 647,730 | 889,785 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 167,636,958 | 140,674,585 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 143,669,260 | 116,554,454 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 533,705 | 596,338 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 1,524,070 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 19,097 | 346,603 |
| අත්තිකාරම් ගෙවීම් | | 3,095,026 | 3,629,184 |
| තැන්පතු ගෙවීම් | | 849,347 | 150,551 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 149,690,505 | 121,277,130 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | 17,946,453 | **19,397,455** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 17,946,453 | 19,397,455 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 17,946,453 | 19,397,455 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | (17,946,453) | **(19,397,455)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | | 0 | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

3

### 3.1 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.1.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය : අදාළ නොවේ

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (.රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| | | | | | |

3.1.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය (රු.'000 වලින්)

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 183,650 | 182,960 | 137,665 | 75.2% |
| ප්‍රාග්ධන | 34,300 | 34,300 | 24,740 | 70.7% |

3.1.3 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන : නැත

රු0.00.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | | | | | |

### 3.1.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු0.00.

| වත්කම් ශේෂය | කේත විස්තරය | 2022-12-31 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2022-12-31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 114,393,231 | 114,393,231 | | 100% |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |
| 9180 | මූල්‍ය කල්බදු වත්කම් | 21,719,660 | 21,719,660 | | 100% |

## 04 පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII පරිච්ඡේදය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති රාජකාරී ඉටු කිරීම සඳහා සහාය වීම. | 100% | | |
| අමාත්‍ය මණ්ඩල කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන වෙත මාර්ගෝපදේශ, උපදෙස් සහ තොරතුරු සැපයීම; 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අනුව පොදු මහජනතාව වෙත තොරතුරු ලබා දීම. | 100% | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ තුළ අන්තර්ගත යෝජනාවන්හි සඳහන් ප්‍රතිපත්ති සහ නෛතික කරුණු පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණය කිරීම. | 100% | | |
| කාර්යක්ෂම, සාර්ව සහ ඵලදායී තීරණ ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා සඳහා සහාය වීම. | 100% | | |
| අමාත්‍ය මණ්ඩලයට එරෙහිව ගෙන ඇති නෛතික කටයුතුවලදී නීතිපතිතුමා මඟින් අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීම; විවිධ සංසදයන්හිදී අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීම. | 100% | | |
| කාර්යසාධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මානව සම්පත් සංවර්ධනය. | 91% | | |
| ඉහත සඳහන් කාර්යයන් ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා කාර්යාලය වෙත භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය. | | 80% | |

- 2019-02-26 දිනැති අංක 19/විවිධ(010) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2019-03-06 දිනෙන් පසු, කිසියම් අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කරනු ලබන සංදේශයක් පාදක කර ගනිමින් පුරවැසියන් විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත තොරතුරු ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරන අවස්ථාවන්හිදී එකී අවශ්‍ය තොරතුරු, අදාළ සංදේශය ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය වෙතින් සෘජුවම ලබා ගැනීම සඳහා මග පෙන්වමින් පහසුකම් සැලසිය යුතු වන අතර, ඒ අනුව එදින සිට එපරිදි කටයුතු කර ඇත.

## 05 පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

එක්සත් ජාතීන්ගේ සංවිධානය; සමාජීය, ආර්ථික, දේශපාලනික සංවර්ධනය තුළින් දිළිඳුකම පිටුදකිමින් හා සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමේදී සමස්ත පරිසරය ආරක්ෂා කර ගැනීමත් අරමුණු කර ගනිමින් 2015 වර්ෂයේදී තිරසර සංවර්ධන අරමුණු 17ක් ප්‍රකාශයට පත් කර ඇත. එම තිරසර සංවර්ධන අරමුණු එක් එක් විෂය ක්ෂේත්‍රයට විශේෂිත වන ලෙස හඳුන්වා දී ඇති අතර, අදාළ ඉලක්කයන් 2030 වර්ෂයේදී ළඟා කර ගැනීමට අපේක්ෂිතය. මෙම ඉලක්කයන්, විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ බැවින්, අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා උචිත වැඩසටහන් සකස් කිරීම, ඒවා ක්‍රියාවට නැංවීම සහ තිරසර සංවර්ධන අරමුණුවලට අදාළව ප්‍රගතිය සමාලෝචනය කිරීම අදාළ විෂයභාර අමාත්‍යාංශයේ කාර්යයක් වේ.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරය සැලකීමේදී, තිරසර සංවර්ධන අරමුණු මෙම කාර්යාලයේ කාර්යයන් හා සෘජුවම සම්බන්ධ කළ නොහැක. රජයේ කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා වන සියලුම ප්‍රතිපත්තිමය තීරණයන් ලබා ගැනීමට අවශ්‍ය වන සහාය දැක්වීම මෙම කාර්යාලය මඟින් සිදු කරන බැවින්, විවිධ අමාත්‍යාංශ විසින් ප්‍රතිපත්තිමය අනුමැතියන් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී, ඒවායේ අන්තර්ගතය තිරසර සංවර්ධන අරමුණු හා එකඟ ද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

# 06 පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

## 6.1 2022-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

*වගුව 2 - 2022-12-31 දිනට සේවා නියුක්තික වර්ගීකරණය*

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර පදනම මත | කොන්ත්‍රාත් පදනම මත | එකතුව | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 13 | 02 | 15 | 13 | - |
| තෘතියික මට්ටම | 10 | 08 | - | 08 | 02 | - |
| ද්විතියික මට්ටම | 40 | 30 | - | 30 | 10 | - |
| ප්‍රාථමික මට්ටම | 40 | 28 | - | 28 | 12 | - |
| එකතුව | 118 | 79 | 02 | 81 | 37 | - |

## 6.2 2022-12-31 දිනට සිටි කාර්යමණ්ඩලය

*වගුව 3 - 2022-12-31 දිනට කාර්යමණ්ඩල විස්තරය*

| | තනතුර | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර පදනම | කොන්ත්‍රාත් පදනම | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | |
| 01. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | 01 | 01 | - | - |
| 02. | අතිරේක ලේකම් | 03 | 01 | - | 02 |
| 03. | නීති උපදේශක | 01 | - | 01 | - |
| 04. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 06 | 04 | - | 02 |
| 05. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පූර්ණ කාලීනව රාජකාරි ඉටුකිරීමේ පදනම මත) | - | 02 | - | - |
| 06. | අභ්‍යන්තර විගණක | 01 | - | - | 01 |
| 07. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | - |
| 08. | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ.) | 10 | 02 | - | 08 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 09. | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ. නොවන) | 01 | 01 | - | - |
| 10. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 | - | - | 01 |
| 11. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 | 01 | - | - |
| 12. | නීති නිලධාරි | 01 | - | - | 01 |
| 13. | භාෂා උපදේශක | 01 | - | 01 | - |
| **තෘතීයික මට්ටම** | | | | | |
| 14. | සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - | - |
| 15. | පරිපාලන නිලධාරි | 01 | 01 | - | - |
| 16. | භාෂා අධිකාරි | 01 | - | - | 01 |
| 17. | භාෂා පරිවර්තක | 05 | 04 | - | 01 |
| 18. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 01 | 01 | - | - |
| 19. | ප්‍රගති සහකාර | 01 | 01 | - | - |
| **ද්විතීයික මට්ටම** | | | | | |
| 20. | සංවර්ධන නිලධාරි | 04 | 06 | - | (02) |
| 21. | තාක්ෂණ නිලධාරි (විදුලි) | 01 | - | - | 01 |
| 22. | තාක්ෂණ නිලධාරි (සිවිල්) | 01 | - | - | 01 |
| 23. | පුස්තකාලයාධිපති | 01 | - | - | 01 |
| 24. | කළමනාකරණ සේවා නිලධාරි | 31 | 23 | - | 08 |
| 25. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 | 01 | - | 01 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | |
| 26. | රියදුරු | 16 | 14 | - | 02 |
| 27. | කා.සේ.සේ. | 23 | 14 | - | 09 |
| 28. | පිළිගැනීමේ නිලධාරි | 01 | - | - | 01 |
| | **එකතුව** | **118** | **79** | **02** | **39** |

## 6.3 2022 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම/මහත්මීන්.

2022 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යමණ්ඩලය වෙත නිලධාරීන් හය දෙනෙකු (06) අලුතින් එක් විය.

## 6.4 විශ්‍රාම ගැනීම් හා සේවය අවසන් කිරීම්

2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවය කරමින් සිටි නිලධරයින් හතරදෙනෙක් (04) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. නැවත සේවයේ යෙදවූ එක් (01) නිලධරයෙකුගේ සේවය අවසන් කිරීම හා කොන්ත්‍රාත් පදනම මත සේවය කළ එක් (01) නිලධරයෙකුගේ සේවය අවසන් කිරීම ද 2022 වර්ෂයේ දී සිදු කරන ලදී.

## 6.5 ස්ථාන මාරුවීම්

2022 වසර තුළ නිලධාරීන් එක් අයෙකු (01) ස්ථාන මාරුවීම් ලබා අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු වී ඇත.

## 6.6 පුහුණුව හා සංවර්ධනය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යබහුල රාජකාරී ස්වභාවය මධ්‍යයේ පවා 2022 වසර තුළ නිලධාරීන් හැත්තෑ පස් දෙනෙකු (75) සඳහා පුහුණුවීම් අවස්ථා ලබා දීමට මෙම කාර්යාලයට හැකි විය.

පුහුණු වැඩසටහන් තුළින් ලබා ගන්නා දැනුම, කාර්යාලයේ රාජකාරීමය කටයුතු සඳහා ඍජුවම අදාළ කර ගන්නා අතර, එමඟින් පුද්ගල අභිප්‍රේරණය හා ආකල්ප වර්ධනය ද සිදුවේ. ඒ අනුව, එම පුහුණු වැඩසටහන්, කාර්යාල කටයුතුවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව කෙරෙහි ඍජුව හා වක්‍රව දායක වේ. 2022 වර්ෂය තුළදී සැලසුම් කරන ලද පරිදි පුහුණු පාඨමාලා සඳහා කාර්යමණ්ඩල සාමාජිකයින් යොමු කිරීමට හැකිවීම ආයතනික මට්ටමින් ලද ජයග්‍රහණයකි.

**වගුව 4 - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා පවත්වා ඇති පුහුණු වැඩසටහන්**

| | පුහුණු වැඩසටහන | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන තුළ එක් නිලධාරියෙක් පුහුණුව ලද කාලය | සමස්ත ආයෝජනය (රු.) | | වැඩසටහන් ස්වාභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | 4 | පැය : 16 | 40,000.00 | - | දේශීය | භාණ්ඩ සමීක්ෂණය හා භාණ්ඩ අපහරණය පිළිබඳව දැනුම. |
| 2 | ගිණුම්කරණ කාර්යභාර්ය හා ප්‍රායෝගික භාවිතය | 3 | පැය : 16 | 30,000.00 | - | දේශීය | ගිණුම් අංශයේ රාජකාරි කිරීම පහසු වීම |
| 3 | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාර්ය හා වගකීම | 2 | පැය : 8 | 10,000.00 | - | දේශීය | නිවාඩු විෂය සම්බන්ධ දැනුම වර්ධනය කරගැනීම. |
| 4 | හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණ | 1 | පැය : 8 | 5,000.00 | - | දේශීය | හානි පාඩු හා විශේෂයෙන් මු.රෙ. 104 යටතේ විෂය දැනුම ලබාගැනීම. |
| 5 | විනය කාර්ය පරිපාටිය | 2 | පැය : 24 | 30,000.00 | - | දේශීය | කාර්යාලීය විනය සම්බන්ධයෙන් දැනුවත් වීම. |
| 6 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 5 | පැය : 8 | 25,000.00 | - | දේශීය | රජයේ වැටුප් සැකසුම් මෘදුකාංගය (GPS) සම්බන්ධයෙන් විෂය දැනුම ලබාගැනීම. |
| 7 | පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම | 3 | පැය : 8 | 15,000.00 | - | දේශීය | පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම සම්බන්ධ දැනුම වර්ධනය කරගැනීම |
| 8 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 2 | පැය : 16 | 20,000.00 | - | දේශීය | ආයතන හා ගිණුම් සම්බන්ධ දැනුම වැඩිදියුණු කරගැනීම. |
| 9 | දෙමළ භාෂා පුහුණුව - ක.සේ.නි | 7 | පැය : 100 | 70,000.00 | - | දේශීය | දෙවන භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කරගැනීම. |
| 10 | ගිණි ආරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව | 30 | පැය : 4 | 0.00 | - | දේශීය | හදිසි අවස්ථාවක දී ආරක්ෂා වීමේ උපක්‍රම සම්බන්ධයෙන් දැනුවත් වීම. |
| 11 | රියදුරු පුහුණු වැඩසටහන | 15 | පැය : 8 | 23,869.00 | - | දේශීය | රියදුරන් දැනුවත් කිරීම හා අභිප්‍රේරණය ඇති කිරීම. |
| 12 | දෙමළ භාෂා පුහුණුව - කණිෂ්ඨ සේවක | 1 | පැය : 50 | 5,000.00 | - | දේශීය | දෙවන භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කරගැනීම. |
| 13 | පොදු සහ ජාත්‍යන්තර නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | අවු : 01 | 50,000.00 | - | දේශීය | උසස්වීම් සඳහා අදාළ දැනුම ලබා කර ගැනීමට. |

## 07 පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | 2023-02-28 දිනට පෙර ඉදිරිපත් කළ යුතුයි | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | 2023-02-28 දිනට පෙර ඉදිරිපත් කළ යුතුයි | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | - | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014-05-11 දිනැති අංක 17/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | - | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2021 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | - | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | - | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් | - | | |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2021 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම | - | | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල නොවේ | වාර්තාව ප්‍රමාද වීම සහ වාර්තාව දෝෂ සහිත වීම නිසා නැවත ගණනය කිරීමට තීරණය කිරීම | සමීක්ෂණ කටයුතු කඩිනමින් නිම කිරීමට උපදෙස් ලබා දීම හා පුහුණුව ලත් නිලධාරීන් සමීක්ෂණ මණ්ඩල සඳහා පත්කිරීම |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | වාර්තාව ප්‍රමාද වීම සහ වාර්තාව දෝෂ සහිත වීම නිසා නැවත ගණනය කිරීමට තීරණය කිරීම | සමීක්ෂණ කටයුතු කඩිනමින් නිම කිරීමට උපදෙස් ලබා දීම හා පුහුණුව ලත් නිලධාරීන් සමීක්ෂණ මණ්ඩල සඳහා පත්කිරීම |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | වාර්තාව ප්‍රමාද වීම සහ වාර්තාව දෝෂ සහිත වීම නිසා නැවත ගණනය කිරීමට තීරණය කිරීම | |

| | | | | |
|---|---|---|---|---|
| 9 | වාහන කළමනාකරණය කිරීම | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016-12-29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාලවිශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
